(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 1(5).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2020 සැප්තැම්බර් 15 අඟහරුවාදා**

---

**2020 සැප්තැම්බර් 25 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

417/2020

ගරු සුජිත් පෙරේරා මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ, යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වී ඔය නමින් ජලාශයක් ඉදිකිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම ජලාශය ඉදිකිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ජලාශය ඉදි කිරීමෙන් අවතැන් වන පවුල් සංඛ්‍යාව;

(ii) එම අවතැන් වන පවුල් නැවත පදිංචි කිරීමට ගනු ලබන පියවර;

(iii) මෙම ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන්වන පුද්ගලයන්ගේ නිවාසවලට හා ඉඩම්වලට වන්දි ලබා දෙන ක්‍රමවේදය;

(iv) එම අවතැන් වන ජනතාව සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 ඔක්තෝබර් 06 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

9/2020

ගරු හේෂා විතානගේ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අයත්,

(i) කාර්මික ජනපද සංඛ්‍යාව;

(ii) බිම් ඒකක සංඛ්‍යාව;

(iii) කාර්මික ජනපදවල ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව;

(iv) කාර්මික ජනපදවල සේවා නියුක්තයන්ගේ සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2017 වර්ෂයේදී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මධ්‍යම පළාත වෙනුවෙන්,

(i) ස්වයං රැකියා ප්‍රවර්ධනය උදෙසා සිදු කළ වැඩසටහන්;

(ii) එම වැඩසටහන පැවැත් වූ ස්ථාන;

(iii) ලබා දී ඇති උපකරණ;

(iv) ප්‍රතිලාභීන් තෝරාගත් පදනම;

(v) සිදු කරනු ලැබූ තාක්ෂණික පුහුණු වැඩසටහන්;

කවරේද යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ විද්‍යුත් ව්‍යාපාර සිදුකිරීමේ හැකියාව ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන පුද්ගලයන් සඳහා ද විවෘතව පවතින නමුත්, ඒ සඳහා අවශ්‍ය දැනුම ප්‍රමාණවත් පරිදි ලබා දී නොමැති බව පිළිගන්නේද;

(ii) මෙම දැනුම විධිමත්ව ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

58/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2019 වර්ෂයේ පාස්කු ඉරු දින සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාරය සම්බන්ධයෙන්,

(i) ප්‍රශ්න කිරීම්වලට ලක්වූ රාජ්‍ය ආයතනවල හා ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයන් සංඛ්‍යාව;

(ii) අත්අඩංගුවට ගත් රාජ්‍ය ආයතනවල හා ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සේවකයන් සේවයේ යෙදී සිටි රාජ්‍ය/ව්‍යවස්ථාපිත ආයතනවල නම්;

(ii) ඉහත සේවකයන්ගේ නම්, ලිපිනයන් හා ඔවුන් ඉහත සඳහන් ආයතනවල දරන ලද තනතුරු;

(iii) එම සේවකයන්ට එරෙහිව මෙතෙක් ගත් ක්‍රියාමාර්ග;

(iv) ඉදිරියේදී ගැනීමට බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

100/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජනතාවගේ නීති ගැටලු කඩිනමින් විසඳීමටත්, නීති උපදෙස් ලබා ගැනීමටත්, එක් මහේස්ත්‍රාත් අධිකරණ බලප්‍රදේශයක් සඳහා අවම වශයෙන් එක් නීතිඥ වෘත්තිකයෙකු, පොලිස් නඩු මෙහෙයවීමේ නිලධාරී (prosecutor) ලෙස අදාළ බලප්‍රදේශය වෙනුවෙන් පත් කිරීම තුළින් ශ්‍රී ලංකා පොලීසියෙන් සේවය ලබා ගන්නා ජනතාවට විශාල සේවයක් සිදු වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) උක්ත නව තනතුර ස්ථාපිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් තිබේද;

(ii) එසේ නම්, එම අදාළ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

161/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දහම්පුර, පොතුවිල්කුඹුර, අංක 101 වත්තේ අනවසර නිවාස සැලකිය යුතු සංඛ්‍යාවක් තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත නිවාසවල පදිංචි පවුල් අතර රජයේ මහල් නිවාස ව්‍යාපෘතියකින් නිවාස ලබා දෙන ලද පවුල් සිටින්නේද;

(ii) එසේ නම්, එම පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට එම නිවාස ලබා දීමේදී රජය විසින් මුදල් අයකිරීමක් සිදු කර තිබේද;

(iv) එසේ නම්, ඒ කුමක් සඳහාද;

(v) එම නිවාස ලබා දීමේ ප්‍රමුඛතා ලේඛනය සැකසීමේ ක්‍රමවේදය කවරේද;

(vi) එම ප්‍රදේශයේ තවදුරටත් නිවාස ලබා දීමට ඉතිරිව සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(vii) ඔවුන් සඳහා නිවාස ලබා දීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

212/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ,

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ ප්ලාස්ටික් ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය වූ මුදල;

(iii) එම ප්ලාස්ටික් ආනයනය කළ රටවල්;

(iv) එම ප්ලාස්ටික් ආනයනය කළ සමාගම්වල නම්;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට ප්ලාස්ටික් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

304/2020

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂය තුළ ජාතික ළමා ආරක්ෂක අධිකාරියට වාර්තා වූ ළමා අපයෝජන පැමිණිලි සංඛ්‍යාව;

(ii) ඒ අතරින් පරීක්ෂණ අවසන් කර ඇති පැමිණිලි සංඛ්‍යාව;

(iii) පරීක්ෂණ අවසන් කළ පැමිණිලි අතරින් චෝදනා ගොනු කළ පැමිණිලි සංඛ්‍යාව;

(iv) පැමිණිල්ලක් ලැබී, පරීක්ෂණයක් සිදු කර, චෝදනා ගොනු කිරීමට හෝ පැමිණිල්ල නිෂ්ප්‍රභ කිරීමට සාමාන්‍යයෙන් ගත වන කාලය;

(v) පරීක්ෂණ කටයුතු කඩිනම් කිරීමට අධිකාරිය ගෙන ඇති ක්‍රියාමාර්ග;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම පැමිණිලිවලට සම්බන්ධ ළමා වින්දිතයන් අතරින්,

(i) සිය පවුල් ඒකකය සමඟ සිටින සංඛ්‍යාව;

(ii) පවුල් ඒකකයෙන් ඉවත් කර ඇති සංඛ්‍යාව;

(iii) එසේ ඉවත් කිරීමෙන් පසුව ඔවුන්ව රඳවා තබන ස්ථාන;

(iv) තම අධ්‍යාපන කටයුතුවල (විධිමත් හා/හෝ අවිධිමත්) පෙර පරිදි අඛණ්ඩව නිරත වන සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස;

(v) නිසි පුහුණුව ලත් පුද්ගලයන් විසින් මනෝවිද්‍යාත්මක, සාමාජීය සහය ලබා දී ඇති ළමුන් සංඛ්‍යාව;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පැමිණිලිවලට සම්බන්ධ ළමා වින්දිතයන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

10/2020

ගරු හේෂා විතානගේ මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) චීන වරායේ පිහිටි තෙල් ටැංකි සංකීර්ණය බණ්ඩාරනායක පාලන කාලයේදී ස්ටර්ලින් පවුම් 250,000ක් ගෙවා රජයට පවරා ගනු ලැබූ බවත්;

(ii) ඉන් කොටසක් මේ වනවිට ඉන්දියාවට බදු දී ඇති බවත්;

(iii) එම ඉතිරි වී ඇති තෙල් ටැංකිද ඉන්දියාවට බදු දීමට තීරණය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ඉතිරි වී ඇති තෙල් ටැංකි ඉන්දියාවට බදු දෙනවා හැර වෙනත් ඵලදායි විකල්පයක් නොමැත්තේද;

(ii) එම තෙල් ටැංකි ඉන්දියාවට ලබාදීමට එරෙහිව ජනමතයක් රට තුළ ගොඩ නැගී ඇති බැවින්, එම ජනමතයට කන්දීමක් ලෙස ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(iii) එම තෙල් ටැංකි ඉල්ලා ඇති රටවල් සහ ඉල්ලා ඇති පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නිදහසින් පසු අද දක්වාම පැවති විවිධ රජයන් සහ වර්තමාන රජය විසින් මෙම තෙල් ටැංකි සම්බන්ධයෙන් විවිධ අවස්ථාවල ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සහ ව්‍යාපෘති වාර්තා ඇත්නම්, ඒවායේ පිටපතක් බැගින් ලබා දෙන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

**2020 ඔක්තෝබර් 07 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

11/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ සෑම ග්‍රාම නිලධාරි වසමක් සඳහාම "සේවා පියස" කාර්යාලයක් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) එක් "සේවා පියස" කාර්යාලයක් ඉදිකිරීමට ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මෙම වැඩසටහන අවසන් කිරීමට සැලසුම් කර ඇති දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

60/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ක්‍රිකට් විශ්වවිද්‍යාලයක් ඉදිකිරීමට සැලැස්මක් සකස් කර තිබුණේද;

(ii) ඒ සඳහා මහනුවර ප්‍රදේශයෙන් ඉඩමක් මිලදී ගැනීමට මුදල් වියදම් කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා වියදම් කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ඉඩම මිලදී ගැනීමේදී විශාල මූල්‍ය වංචාවක් සිදු කර ඇති බව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නිකුත් කර ඇති වාර්තා මඟින් පෙන්වා දී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඒ සම්බන්ධව අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

102/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුතුරාජවෙල අභය භූමිය ශ්‍රී ලංකාවේ විශාලතම වගුරු බිම බවත්;

(ii) විවිධ සංවර්ධන කටයුතු හේතුවෙන් මෙම අභය භූමිය විනාශ වෙමින් පවතින බවත්;

(iii) මෙම අභය භූමියෙන් අක්කර 406ක් නිවාස ව්‍යාපෘතියක් සඳහා මැල්වත්ත ප්‍රොපටි ඩිවලොපර්ස් නමැති සමාගමකට ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) උක්ත ව්‍යාපෘතිය සඳහා ඉඩම් පර්චසයක් ලබා දී ඇති මිල කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම ගනුදෙනුව නීතිවිරෝධී බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ නම්, මෙම ව්‍යාපෘතියට එරෙහිව ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

163/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි ජල සහ මලාපවාහන පහසුකම් නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම නිවාස ඒකක සඳහා ඉහත පහසුකම් ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

214/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ,

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ ලූණු ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය වූ මුදල;

(iii) එම ලූණු ආනයනය කළ රටවල්;

(iv) එම ලූණු ආනයනය කළ සමාගම්වල නම්;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට ලූණු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 ඔක්තෝබර් 08 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

13/2020

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිරිවෙන් අධ්‍යාපන ආයතන සඳහා ගුරුවරුන් බඳවා ගැනීමේදී සලකා බලනු ලබන මූලික අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) දැනට පිරිවෙන් අධ්‍යාපන ආයතනවල ගුරු පුරප්පාඩු පවතින්නේද;

(iii) එසේ නම්, ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය මගින් පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

61/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ වනතෙක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ තනතුරු දරන ලද/දරන පුද්ගලයන්ගේ නම් හා ඔවුන්ගේ තනතුරු කවරේද;

(ii) එම කාලසීමාව තුළ එක් එක් පුද්ගලයා නිරත වූ නිල විදේශ සංචාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් නිලධාරියාගේ නිල විදේශ සංචාර සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම නිල විදේශ සංචාර තුළින් ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවට අත් වූ ප්‍රතිලාභ කවරේද;

(v) යම් ප්‍රතිලාභයක් ලබා තිබේ නම්, ඒ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

103/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දුම්රිය මෙහෙයුම් ක්‍රියාවලිය යල් පැන ගොස් ඇති බවත්;

(ii) මෙහෙයුම් මධ්‍යස්ථානයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන බවත්;

(iii) ප්‍රවේශපත් නිකුත් කිරීමේ ක්‍රමවේදය වෙනස් විය යුතු බවත්;

(iv) ඒ සඳහා නව තාක්ෂණික ක්‍රමවේද භාවිතා කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) දුම්රිය මෙහෙයුම් ක්‍රියාවලිය සඳහා නව මෙහෙයුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කරන මුදල කොපමණද;

(iii) නව ප්‍රවේශපත් නිකුත් කිරීමේ ක්‍රමවේද හඳුන්වා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම ක්‍රමවේද කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

164/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2020 සිට 2024 දක්වා කාලය තුළ රජය විසින් ගෙවීමට ඇති, දේශීය හා විදේශීය ණය මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ණය ලබාගත් දිනය හා ව්‍යාපෘතීන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම ණය මුදල්වල වාරික ගෙවීම සඳහා රජය විසින් සකසා ඇති වැඩපිළිවෙළ කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

215/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ,

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ තල ධාන්‍ය ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය වූ මුදල;

(iii) එම තල ධාන්‍ය ආනයනය කළ රටවල්;

(iv) එම තල ධාන්‍ය ආනයනය කළ සමාගම්වල නම්;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට තල ධාන්‍ය ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 ඔක්තෝබර් 09 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

15/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.02.01 දින සිට මේ දක්වා නීතිවිරෝධී මත්ද්‍රව්‍ය අලෙවිය හා භාවිතය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) නීතිවිරෝධී මත්ද්‍රව්‍ය මර්දනය කිරීම සඳහා ක්‍රියා කරනු ලබන රාජ්‍ය හෝ රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතනවල නම් කවරේද;

(iii) එම එක් එක් ආයතනය මඟින් අත්අඩංගුවට ගනු ලැබූ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

63/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ වනතෙක් සිදු කරන ලද නීතිවිරෝධී මත්ද්‍රව්‍ය වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැටලීම් මඟින් අත්අඩංගුවට ගත් නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එසේ අත්අඩංගුවට ගත් නීතිවිරෝධී මත්ද්‍රව්‍ය, පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය හරහා නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අතට නැවත පත්වී ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) ඒ සම්බන්ධව ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

105/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2017.01.01 සිට 2019.01.01 දක්වා ශ්‍රී ලංකා පොලීසිය, පොලිස් විශේෂ කාර්ය බලකාය සහ සුරාබදු දෙපාර්තමේන්තුව යන එක් එක් ආයතන විසින්,

(i) සිදු කරන ලද කෘත්‍රිම රා වැටලීම් සංඛ්‍යාව;

(ii) අත්අඩංගුවට ගත් කෘත්‍රිම රා ලීටර් ප්‍රමාණය;

(iii) සිදු කරන ලද වැටලීම් මඟින් අයවූ දඩ මුදල්වල වටිනාකම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඇතැම් රා නිෂ්පාදකයන්ට අනුමත ප්‍රමාණයට වඩා ගබඩා පහසුකම් පවතින බවත්;

(ii) ඔවුන් කෘත්‍රිම රා නිෂ්පාදනය කර ගබඩා කරන බවත්;

(iii) පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් කෘත්‍රිම රා අත්අඩංගුවට ගත්තද, ඇතැම් සුරාබදු නිලධාරින් විසින් ඒවා අධිකරණයට ඉදිරිපත් නොකර, තාක්ෂණික දෝෂ ලෙස පෙන්වා සමථ ගාස්තුවකට යටත්ව වැරදිකරුවන් නිදහස් කරන බවත්;

(iv) කෘත්‍රිම රා නිෂ්පාදනය, තාක්ෂණික දෝෂයක් නොව, ඇතැම් සුරාබදු නිලධාරින් විසින් චේතනාන්විතව එම නිෂ්පාදකයන් ආරක්ෂා කිරීමක් බවත්;

(v) මෙමඟින් රජයට විශාල බදු මුදලක් අහිමි වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) කෘත්‍රිම රා නිෂ්පාදනය නැවැත්වීමට අදාළ නීති, සංශෝධනයට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

166/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉඩම් ඔප්පු හිමිකම් නොමැති නිවාස සංඛ්‍යාව කවරේද;

(ii) එම නිවාස සඳහා ඔප්පු ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

217/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ,

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ මුං ඇට ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය වූ මුදල;

(iii) එම මුං ඇට ආනයනය කළ රටවල්;

(iv) එම මුං ඇට ආනයනය කළ සමාගම්වල නම්;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට මුං ඇට ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?